# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/43 – 2017 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා – 2017.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව

**සංශෝධන අංක 02**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1982/15 හා 2016.08.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත, අංක 1894/26 දරන 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**ඒ. කුලතුංග**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2017 දෙසැම්බර් මස 20 වැනි දින
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය

**7.2.2.2 වගන්තිය පහත පරිදි ඇතුළත් කරනු ලැබේ.**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක්/උසස් ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/තොරතුරු තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500 කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම.

හෝ

1A – PG 3839 – 507 (2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්,

*(අ)* පරිගණක/තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) හෝ ඊට ඉහළ සහතිකය ලබා තිබීම.

හෝ

*(ආ)* පැය 1500 ට නොඅඩු පරිගණක/තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම.

**7.3.1.2.1(4) (i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) හෝ ඊට ඉහල NVQ සහතිකයක් ලබා තිබීම.

**7.3.2.2.3(අ) (i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

3 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**7.3.2.2.3(අ) (ii) වගන්තිය ඉවත් කරනු ලැබේ.**

**7.3.2.2.3(ආ) (ii) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

මෙම සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2.1 හි අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

*සටහන :* 7.3.1.2.1(4) (ii) හි සඳහන් වෘත්තීය පළපුරුද්ද සීමිත බඳවාගැනීමේ අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**7.4.1.2.1(3) (i) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) හෝ ඊට ඉහල NVQ සහතිකයක් ලබා තිබීම.

**7.4.2.2.3(1) (ආ) වගන්තිය ඉවත් කරනු ලැබේ.**

**7.4.2.2.3(2) (ආ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

7.4.1.2.1 හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම.

*සටහන :* 7.4.1.2.1(3) (ii) හි සඳහන් වෘත්තීය පළපුරුද්ද සීමිත බඳවාගැනීමේ අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**7.3.2.2.3(2) (ආ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

**11.1 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

**11.1 තනතුරුවලට පත්කිරීමේ සුදුසුකම්**

| තනතුර | සුදුසුකම් |
|---|---|
| අධ්‍යක්ෂ | 1 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 1 පන්තියේ I හෝ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම |
| සහකාර අධ්‍යක්ෂ | 1 පන්තියේ I හෝ II හෝ III ශ්‍රේණියේ නිලධරයෙකු වීම |

**11.1.1 තෝරාගනු ලබන ආකාරය**

**(i) I පන්තියේ I/ II ශ්‍රේණියේ තනතුරු**

අදාළ සුදුසුකම් ලබන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත පරිදි ලකුණු ලබාදීමේ ශීර්ෂයන් යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අවස්ථාවෝචිතව අනුමත කරනු ලබන විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| (1) ජ්‍යෙෂ්ඨතාවය (60%) | 60 |
| (2) කුසලතා (40%) | |
| I අධ්‍යාපන සුදුසුකම් | 15 |
| II වෘත්තීය සුදුසුකම් | 10 |
| III තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද නව නිර්මාණ/වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ/ත්‍යාග/ප්‍රශංසා | 10 |
| IV සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 |

*සටහන* : විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවන අවස්ථාවේදී අදාළ ආයතන විසින් සුදුසු පරිදි සකස්කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතුය.

**(ii) I පන්තිය III ශ්‍රේණියේ තනතුරු**

අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවස්ථාවෝචිතව තනතුරුවලට පත්කරනු ඇත.

**3 වැනි උපලේඛනයෙහි 5 වගන්තියෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධතීන්/මෘදුකාංග/දෘඩාංග පිළිබඳ දැනුම, වෙබ් හා අනෙකුත් තොරතුරු පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂාව, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Data Base) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, පරිගණක ජාල කළමනාකරණය පිළිබඳ දැනුම, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

**4 වැනි උපලේඛනයෙහි 5 වගන්තියෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති/මෘදුකාංග/දෘඩාංග පිළිබඳ දැනුම, e රාජ්‍ය (e-gov) සංකල්පය වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, තොරතුරු පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Data Base) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, දෘඩාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණ සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික තැපැල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අධීක්ෂණ හැකියාව ගැඹුරු ලෙස පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |

01-223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.